

# ‘ඔවුන් ද ගොවීන් මිස අන් කවුරුන් ද ?’

## ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන්ට බලපාන ප්‍රධාන ම බාධක සහ පවත්නා ස්ත්‍රී පුරුෂ සමාජභාවී විෂමතාවන් විසඳීම සඳහා ඉලක්කගත ප්‍රායෝගික නිර්දේශ


**රශ්මිනි ද සිල්වා**



**ඔක්තෝබර්, 2020**

LAW & SOCIETY TRUST

WE EFFECT

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය තුළ කාන්තාවන් වැදගත් කාර්යභාරයක් ඉටු කරන නමුත්, ඔවුන්ගේ දායකත්වය ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ හඳුනාගැනීමට ලක්නොවේ. ආහාර නිෂ්පාදනයේ දී කාන්තාවන් දක්වන දායකත්වය ඉතා වැදගත් ය. ආහාර පද්ධති ශක්තිමත් කිරීම සහ වෙළෙඳපොළ ආර්ථිකයේ නිරතවීම වෙනුවෙන් තම පූර්ණ හැකියාවන් භාවිත කිරීමට බාධා වන බාධක රැසකට ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන් මුහුණ දී තිබේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා වෙනස් කොට සැලකීමේ ප්‍රතිපත්ති හා භාවිතයන් හේතුවෙන් පීඩාවට පත් කාන්තා ගොවීන්ගේ බිම් මට්ටමේ යථාර්ථයන් මූලික වශයෙන් දේශීය කෘෂිකාර්මික අංශයට ඔවුන්ගේ දායකත්වය නොතකා ඔවුන් ගොවීන් ලෙස සලකන්නේද නැද්ද යන්න පිළිබඳ ව වූ අවිනිශ්චිතතාවට හේතු වී තිබේ. මෙම ලේඛනයෙන් කාන්තා ගොවීන්ට බලපාන ප්‍රධාන බාධක පහක් දක්වා තිබේ: 1. ස්වභාවික සම්පත් සඳහා ප්‍රවේශය සහ පාලනය නොමැතිවීම, 2. වෙළෙඳපොළ වෙත ප්‍රවේශය නොමැතිවීම, 3. මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය නොමැතිවීම, 4. තාක්ෂණය සඳහා ප්‍රවේශය නොමැතිවීම, 5. රැකබලා ගැනීමේ වගකීම්.

**ප්‍රධාන නිර්දේශයන්:**

- ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත වෙනස්කොට සැළකීමේ නීතිමය, ප්‍රතිපත්තිමය සහ පරිපාලන පිළිවෙත් සංශෝධනය කිරීම.
- රජය විසින් සපයනු ලබන උපකාරක සේවාවන් සඳහා සුදුසුකම් ලබා ගැනීම වෙනුවෙන් ඉඩම් හිමිකම පූර්ව අවශ්‍යතාවක් වන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සැපයීමේ කොන්දේසි ප්‍රතිසංස්කරණය කිරීම.
- කාන්තා ගොවියෙකුගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩි කිරීම වෙනුවෙන් වැඩසටහන් නිර්මාණය කිරීම සහ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්ගෙන් සහය ලබා දීම ශක්තිමත් කිරීම.
- කාන්තා ගොවීන් ඉලක්ක කර ගනිමින් ප්‍රවාහන පහසුකම් සහ වෙළඳපොළ අවකාශ ඇතුළු යටිතල පහසුකම් සකස් කිරීම.
- කාන්තා ගොවීන් නායකයින්, ව්‍යවසායකයින් සහ ගොවි ප්‍රජාවන් අතර තීරණ ගන්නන්, වෙළෙඳපොළ පද්ධතිවල පාර්ශවකරුවන් සහ අනාගත ගැනුම්කරුවන් ලෙස නිරූපණය කිරීමේ ව්‍යාපාර ආරම්භ කිරීම.
- විශේෂයෙන් කාන්තා-ගොවීන් ඉලක්ක කර ගනිමින් දිගු ආපසු ගෙවීමේ කාල සීමාවන් සහිත අඩු පොලී ණය යෝජනා ක්‍රම නිර්මාණය කිරීම.
- සියලුම තාක්ෂණික දැනුම හා නිපුණතා පුහුණු වැඩසටහන් සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස කාන්තා ගොවීන්ගේ සමාන සහභාගීත්වය නියම කරනු ලැබීම.
- පිරිමි කාර්යයන් සහ කාන්තා කාර්යයන් පිළිබඳ සමාජ සම්මතයන් ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ ව ගොවි ප්‍රජාවන් සහ කෘෂිකර්ම උපදේශකයින් සංවේදී කිරීම
- කාන්තා ගොවීන් සඳහා භාවිතයට පහසු තාක්ෂණික යෝජනා ක්‍රම හඳුන්වාදීම.
- කාන්තාවන්ට පමණක් පැවරි ඇති රැක බලා ගැනීමේ වගකීම් බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ පාර්ශ්වකරුවන් සහ සංවර්ධන ආයතන අතර ප්‍රතිපත්තිමය සංවාද ඇති කිරීම.

* මෙම ලිපියේ අනුප්‍රාප්තික කොටස්වල එක් එක් නිශ්චිත බාධක යටතේ වැඩිදුර නිර්දේශයන් දක්වා තිබේ.

# හැඳින්වීම

කාන්තාවන්ගේ දායකත්වය ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ හඳුනාගැනීම හෝ පිළිබිඹුවීම සිදුනොවූව ද, ඔවුන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ වැදගත් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරමින් සිටියි. ආහාර නිෂ්පාදනයේ දී සහ ආහාර සුරක්ෂිතතාව සඳහා කාන්තාවන් දක්වන දායකත්වය ඉතා ම වැදගත් වේ. ලෝකයේ වගා කරන ආහාර වලින් 50% කට වඩා වැඩි ප්‍රමාණයක් නිෂ්පාදනය කිරීම දකුණු ආසියාවේ සහ උප සහරා අප්‍රිකාවේ කාන්තාවන් විසින් සිදුකරනු ලැබේ (ආහාර හා කෘෂිකර්ම සංවිධානය, 2011). කෙසේ වෙතත්, ගෝලීය වශයෙන් ද, ශ්‍රී ලංකාව තුළ ද කාන්තා ගොවීන් ආහාර පද්ධති ශක්තිමත් කිරීම සහ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම සඳහා ඔවුන්ගේ පූර්ණ හැකියාවන් භාවිත කිරීම වළක්වන බාධක රැසකට මුහුණ දී සිටිති.

කාන්තා ගොවීන් මුහුණ දෙන එකිනෙකට සම්බන්ධ, සමාජ-සංස්කෘතික හා දේශපාලන ක්ෂේත්‍රයන්හි අවධානයට ලක් නොවී ඉතිරි ව ඇති බාධක බොහොමයක් පවතී. ස්වභාවික සම්පත්, වෙළෙඳපොළ, මූල්‍ය සේවා, තාක්ෂණය සහ රැකවරණය පිළිබඳ වගකීම් සඳහා ප්‍රවේශ වීම සහ පාලනය කිරීම සම්බන්ධ එවැනි බාධක 5 ක් මෙම ලිපියෙන් හඳුනාගෙන තිබේ. සාර්ව මට්ටමින්, කාන්තා ගොවීන් සඳහා රජයේ වියදම්වල දී පිළිගැනීමක් හෝ වැදගත්කමක් ලබා දී නැත. එබැවින් ඔවුන් මට්ටම් දෙකකින් බැහැර වීමට මුහුණ දී තිබේ - කාන්තාවන් වශයෙන් සහ කුඩා පරිමාණ ආහාර නිෂ්පාදකයින් ලෙස (ඔක්ස්ෆෑම්, 2017).

ශ්‍රී ලංකාවේ, ආර්ථිකය පුළුල් වුව ද, කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය (FLFP) 2016 දී 41% සිට 36% දක්වා පහත වැටීමක් පෙන්නුම් කරයි (ලෝක බැංකුව, 2017). මෙම අඛණ්ඩ ව පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවී පරතරය හේතුවෙන් පීඩාවට පත් කාන්තා ගොවීන්ගේ බිම් මට්ටමේ යථාර්ථයන්ට හේතු වී ඇත්තේ පිරිමින්ට වඩා කාන්තාවන්ට අසමාන ලෙස බර පැටවෙන රැකවරණ වගකීම්වල සිට, කාන්තාවන්ගේ සංචරණයට ඇති බාධා (සමාජ අවහිරතා හේතුවෙන්), කාන්තාවන්ට යම් තාක්ෂණික කුසලතා අත්කර ගැනීමට, සම්පත් වෙත ප්‍රවේශ වීමට සහ තීරණ ගැනීමේදී බාධා ඇතිකරවන ආර්ථික භූමිකාවන්හි ස්ත්‍රී පුරුෂ සමාජභාවී භේදය වැනි හේතු රාශියකි.

බොහෝ විට නුපුහුණු ශ්‍රමයේ යෙදවීමට අපේක්ෂා කෙරෙන කාන්තාවන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ විවිධ වූ භූමිකාවන් ඉටු කරමින් සිටියි. පිරිමින් ගම්වල සිට නගරය දක්වා සංක්‍රමණවීම වැඩිවීමත් සමඟ ග්‍රාමීය ප්‍රදේශවල කාන්තාවන්ට කෘෂිකාර්මික කටයුතුවලදී වැඩි වගකීම් දැරීමට සිදු වී තිබේ. දේශීය සන්දර්භය තුළ කෘෂිකර්මාන්තය ස්ත්‍රීකරණය කිරීමේ මෙම සංසිද්ධිය ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා වෙනස් කොට සැලකීම් හා අසමානතාවන් සමඟම පැවතීම මගින්, කාන්තා ගොවීන්ට කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඔවුන්ගේ කාර්යභාරයන් ඉටු කිරීමට බාධා ඇතිවේ. මෙම සාරාංශය මගින් ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන්ට බලපාන ප්‍රධාන බාධක 5 ක් සඳහා නිර්දේශ සපයනු ලැබේ.

**ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන්ට ඇති හඳුනාගත් ප්‍රධාන බාධක:**

- ස්වභාවික සම්පත් සඳහා ප්‍රවේශය සහ පාලනය නොමැති වීම
- වෙළෙඳපොළ සඳහා ප්‍රවේශය නොමැති වීම
- මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය නොමැති වීම
- තාක්ෂණය සඳහා ප්‍රවේශය නොමැති වීම
- රැකවරණ වගකීම්

# 01. ස්වභාවික සම්පත් සඳහා ප්‍රවේශය සහ පාලනය

සංවර්ධනය වෙමින් පවතින රටවල ආහාර නිෂ්පාදනයෙන් 60 - 80% ක් සඳහා කාන්තා ගොවීන් වගකිව යුතු නමුත්, ඔවුන් ට හිමි ව ඇත්තේ ඉඩම් වලින් 2% ක් පමණි (ඔක්ස්ෆෑම්, 2010). කෘෂිකර්මාන්තයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතාවන්, විශේෂයෙන් ම ස්වභාවික සම්පත් වෙත ප්‍රවේශ වීම සහ පාලනය කිරීම සම්බන්ධ ව විශාල වේ. ශ්‍රී ලංකාවේ, ඉඩම් නොමැති වීම හෝ ඉඩම් සඳහා ප්‍රවේශය නොමැතිකම කාන්තාවන් කෘෂිකර්මාන්තයට සහභාගී වීම වළක්වනවා පමණක් නොව, වටිනාකම් නිපදවීමේ දාමයන්හි නුපුහුණු කම්කරුවන් සහ ප්‍රාථමික නිෂ්පාදකයින් වශයෙන් ඔවුන්ගේ භූමිකාව ද එකතැන පල්වීමට ලක්වේ. ගොවියෙකු ලෙස පිළිගැනීමට ප්‍රධාන සාධකයක් වන්නේ ඉඩම් හා ඉඩම් හිමිකම සඳහා ඇති ප්‍රවේශයයි. ඉඩම් හිමිකාරිත්වය නොමැතිකම හේතුවෙන් ප්‍රතිපත්තිවල දී හා භාවිතයේ දී කාන්තා ගොවීන් මුහුණ දෙන බැහැරවීම ජලය, මූල්‍ය සේවා, වෙළෙඳපොළ සහ ව්‍යාප්ති සේවා ඇතුළු බොහෝ දේ සඳහා ප්‍රවේශවීමේ බාධක ඇතිවීමට හේතු වී තිබේ.

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගෙන් 16% ක් දෙනාට පමණක් පෞද්ගලික ඉඩම් හිමිකම තිබීම මගින් හා බිම් මට්ටමේ යථාර්ථයන් මගින් පෙන්නුම් කරන්නේ හිමිකාරිත්ව නොමැතිකම කාන්තා ගොවියෙකුට ඇගේ පිරිමි සගයන් මෙන් කෘෂිකාර්මික වත්කම් හා සේවාවන් ලබා ගැනීමට බාධා වන බවයි (සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2002). ඉඩම් සඳහා ප්‍රවේශය නොමැතිකම තිබිය දී ත්, කාන්තාවන් දිගින් දිගටම කෘෂිකාර්මික කටයුතුවල නිරත වන නමුත්, ඔවුන් යැපුම් ගොවිතැනේ සුළු ධාරිතාවන් තුළ හෝ ගොවිබිම්වල දෛනික වැටුප් ලබන කම්කරුවන් ලෙස පමණක් කටයුතු කරමින් සිටියි. ඉහත සඳහන් ක්‍රියාකාරකම් ඉතා අඩු ආදායමක් ලබා දෙන අතරම බොහෝ විට ඒවා කන්නයට පමණක් හා අක්‍රමවත් ව සිදු වේ.

පවත්නා යල් පැන ගිය වෙනස් කොට සැලකීම් සහිත ඉඩම් නීති සහ රෙගුලාසිවලට ඉඩම් හිමිකාරිත්වයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විෂමතා හේතු වේ. චාරිත්‍රමය නීතිවල සහ ඉඩම් සංවර්ධන ආඥා පනත (LDO) තුළ ඉඩම් හිමිකාරිත්වයේ අසමානතාවන් පැහැදිලි ව පෙනේ. ඉඩම් සංවර්ධන ආඥා පනතේ තුන්වන ඇමිණුමේ ගැහැණු උරුමක්කාරයෙකුට වඩා පිරිමි උරුමක්කාරයාට ප්‍රමුඛතාවක් ලබා දී තිබේ. පුරුෂයින්ට, විශේෂයෙන් පවුලක බාල ම පිරිමි දරුවාට උරුම පිළිබඳ ව සළකා බැලීමේ පිළිවෙත ග්‍රාමීය කාන්තාවන්ගේ ඉඩම් හිමිකාරිත්වයට පවතින දැඩි බාධාවක් ලෙස සැලකිය හැකි ය. ඒ හා සමාන ව, උඩරට නීතියේ, තේසවලාමේ නීතියේ සහ මුස්ලිම් නීතියේ කොටස් මගින් පුරුෂයින්ට ඉඩම් වත්කම් පිළිබඳ ව තීරණ ගැනීමේ සහ පාලනය කිරීමේ අයිතිය පවරා තිබේ. නාගරික ප්‍රදේශවල මෙම සංසිද්ධීන් එතරම් ප්‍රචලිත ව නොතිබුණ ද, ග්‍රාමීය ගොවි ප්‍රජාවන් ඉහත සඳහන් සම්ප්‍රදායික නීතිවලට තදින් අනුකූල වේ - කාන්තා ගොවියෙකුට පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියා කිරීමේ හැකියාව ඒ මගින් තවදුරටත් අඩ ම කෙරේ.

බොහෝ විට බැංකුවලින් ණය ලබා දීමේ දී ඉඩම් ඇප වශයෙන් ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. විධිමත් ණය යෝජනා ක්‍රම සහ මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය නොමැති ව කාන්තා ගොවීන් බොහෝ දුෂ්කරතාවන්ට පත් වේ. ඉඩම් හිමිකාරිත්වය නොමැතිකම නිසා අනිවාර්යයෙන් ම රටේ කාන්තා ගොවීන් නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් ඉහළ පොලී ණය ලබා ගැනීම වෙනුවෙන් වඩාත් අවදානමට ලක්විය හැකි ය.

ඉඩම් අයිතිය නොමැතිකමේ ප්‍රතිවිපාක ශ්‍රී ලංකාවේ කාන්තා ගොවියෙකුට විවිධාකාරයෙන් බලපෑම් ඇති කරනු ලැබේ. ඉඩම් හිමිකමක් නොමැති අවස්ථාවක, කාන්තා ගොවියෙකුට රජය විසින් පවත්වාගෙන යනු ලබන ගොවිජන සේවා මධ්‍යස්ථානවල ලියාපදිංචි වීමට අවසරය නැත. ඉඩම් හිමිකමක් අත්පත් කර ගැනීම රජයේ වැඩසටහන් සඳහා ලියාපදිංචි වීම, ව්‍යාප්ති සේවා, වෙළෙඳපොළ තොරතුරු, පුහුණුව, සහනාධාර ලබා ගැනීම සහ ගොවි සංවිධානවල සාමාජිකත්වය සඳහා ද සුදුසුකම් ලබා ගැනීම වෙනුවෙන් පූර්ව අවශ්‍යතාවක් ලෙස ක්‍රියා කරයි. වාරිමාර්ග සංවිධාන මගින් පිළිගනු ලබන්නේ ඉඩම් හිමි ගොවීන් පමණි. මෙය ඉඩම් නොමැති ග්‍රාමීය කාන්තා ගොවියෙකුට කෘෂිකාර්මික කටයුතු සඳහා රජය විසින් සපයනු ලබන වාරිමාර්ග යෝජනා ක්‍රම වෙත ප්‍රවේශ වීම අහිමි කරයි (FAO, 2018). ගොවි සංවිධාන හා වාරිමාර්ග සංවිධානවල නොසිටීම මගින් කාන්තාවන්ට ඔවුන්ගේ ගැටලු පිළිබඳ ව හඬ නැගීමටත්, ගොවියෙකු ලෙස අනන්‍යතාව සහ පිළිගැනීම පිළිබඳ හැගීමක් ලබා ගැනීමටත් අවස්ථාව නැති කෙරනු ලැබේ.

**නිර්දේශයන්:**

- විශේෂයෙන් ම කාන්තාවකගේ ඉඩම් සඳහා ඇති අයිතිය වළක්වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා වෙනස් කොට සැළකීමේ නෛතික, ප්‍රතිපත්තිමය සහ නියාමන පිළිවෙත් සංශෝධනය කිරීම.
- රජය විසින් සපයනු ලබන උපකාරක සේවාවන් සඳහා සුදුසුකම් ලබා ගැනීම සඳහා ඉඩම් හිමිකම පූර්ව අවශ්‍යතාවක් වන කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සැපයීමේ කොන්දේසි ප්‍රතිසංස්කරණය කිරීම.
- කාන්තාවන්ට ඉඩම් අයිතිය අනිවාර්ය නොවන පරිදි ගොවි සංවිධාන සහ වාරිමාර්ග සංවිධාන සඳහා සාමාජිකත්වය ලබා දීමේ යාන්ත්‍රණය වෙනස් කිරීම.
- ක්‍රියාකාරී වෙළෙඳපොළ ආර්ථිකයට ඔවුන්ගේ සහභාගීත්වය දිරිගැන්වීම සඳහා කාන්තා ගොවීන්ට LDO මගින් ඉඩම් ලබා දීමේදී ප්‍රමුඛතාව ලබා දීම.
- ඉඩම් හිමිකම හා වාරිමාර්ග යෝජනා ක්‍රමවලට ප්‍රවේශ වීම සම්බන්ධව කාන්තා ගොවීන් මුහුණ දෙන ගැටුම් නිරාකරණය කිරීම සඳහා අමාත්‍ය මට්ටමේ සිට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටම දක්වා රජයේ බලධාරීන් විසින් ප්‍රමුඛතාව ලබා දීම.
- ඉඩම් නොමැති කාන්තා ගොවීන් ගොවීන් ලෙස සැලකීමත් එම රාජ්‍ය සේවාවන්ට ම හිමිකම් ලැබීමත් ප්‍රවර්ධනය කරන රාජ්‍ය ප්‍රතිපත්තිමය කතිකාවක් ඇති කිරීම.

## 02. වෙළෙඳපොළ සඳහා ප්‍රවේශය

ශ්‍රී ලංකාවේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනයේ කාන්තාවන්ගෙන් නියෝජනය 34.3% ක් පමණි. මෙම රැකියාවල නියුතු කාන්තාවන් අතර දළ වශයෙන් 27.7% ක් කෘෂිකාර්මික අංශයේ සේවය කරති (සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2020). මෙම කාන්තාවන්ගෙන් බහුතරයක් යැපුම් ගොවිතැනෙහි නිරත වන අතර වාණිජමය කෘෂිකාර්මික මට්ටම්වලට පිවිසීම සහ ඉහළ මට්ටමේ වටිනාකම් ඉපැයීම් දාමයන්හි නියැලීම සහ වෙළෙඳපොළ වෙත සමස්ත ප්‍රවේශය ලබා ගැනීම සඳහා නොයෙකුත් බාධක වලට මුහුණ දෙති.

මෙම ප්‍රතිපත්ති සාරාංශය තුළ දිගින් දිගටම ඉස්මතු වන පරිදි, සම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සමාජ සම්මතයන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා වෙනස් කොට සැලකීමේ ප්‍රතිපත්ති හා භාවිතයන් පැවතීම හේතුවෙන් කාන්තා ගොවියෙකුට වෙළෙඳාමේ යෙදීමට සහ වෙළෙඳපොළ ආර්ථිකය තුළ රැඳී සිටීමට බාධා වේ. කාන්තාවකට භෞතික ව වෙළෙඳපොළ කරා ළඟා වීමට සහ වෙළෙඳපොළ විකල්පයන් තෝරාගැනීමට තීරණාත්මක වන සාධකයක් ලෙස සංචරණය සඳහා ඇති බාධාවන් හඳුනාගෙන තිබේ. කාන්තා ගොවියෙකුගේ සංචලතාවයේ මට්ටමට බාධාවන ප්‍රධාන සාධකයක වන්නේ ගෙදර දොරේ වැඩ වැනි ඇගේ රැකවරණ වගකීම් ය. නිසි ප්‍රවාහන හා යටිතල පහසුකම් නොමැතිකම කාන්තා ගොවීන්ට වෙළෙඳපොළ පද්ධතියට පිවිසීමට සහ ගොවි සංවිධාන හා සමුපකාර සඳහා සහභාගී වීමට තවදුරටත් බාධාවක් වේ. ඉහත සඳහන් වර්ගීකරණ කාණ්ඩයන් සමග කාන්තා නිෂ්පාදක කණ්ඩායම් සම්බන්ධ නොවීම නිසා වෙළෙඳපොළ සම්බන්ධ තොරතුරු වෙත ප්‍රවේශය තවදුරටත් අඩු කරයි.

කාන්තා ගොවීන්ට ඔවුන්ගේ ගොවිතැන් කටයුතු යැපුම් මට්ටමේ සිට වාණිජ නිෂ්පාදන මට්ටම දක්වා ඉහළ නැංවීමටත් පසුව වටිනාකම් දාමයන් දක්වා ඉහළ නැංවීමටත් හැකිවන වෙළෙඳපොළ සම්බන්ධතා සහ මූල්‍ය සම්පත් සාපේක්ෂ ව අඩු මට්ටමක තිබේ. වෙළෙඳපොළ තොරතුරු ලැබීම, වෙළෙඳපොළ හඳුනා ගැනීම, තීරණ ගැනීම, කේවල් කිරීම සහ සමස්ත වෙළෙඳපොළ ආර්ථිකය තුළ සාකච්ඡා කිරීම පිරිමින්ගේ කාර්යයක් ලෙස සැලකේ. තව ද, කාන්තා ගොවීන්ට ප්‍රාථමික නිෂ්පාදකයෙකු ලෙස සිට වටිනාකම් දාමයේ ඉහළ මට්ටම් කරා උසස් කිරීමට හැකිවන විශේෂිත වෙළෙඳපොළ සහතිකකරණයට අදාළ තොරතුරු හා සේවාවන් සඳහා ප්‍රවේශය ලැබෙන්නේ කලාතුරකින් ය.

**නිර්දේශයන්:**

- කාන්තා ගොවීන්ගේ ව්‍යවසායකත්ව කුසලතා ධාරිතාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් නිර්මාණය කිරීම සහ කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන්ගෙන් සහය ලබා ගැනීම.
- වෙළෙඳපොළ පද්ධති, වෙළෙඳපොළ ඉල්ලීම්, නිෂ්පාදන සහ සිල්ලර වෙළෙඳාම් අවස්ථා පිළිබඳ ව කාන්තා ගොවීන්ට තොරතුරු බෙදාහැරීමට හා යාවත්කාලීන කිරීමට යාන්ත්‍රණ ස්ථාපිත කිරීම. ව්‍යාප්ති සේවා, කෘෂිකර්ම නිලධාරීන් සහ ගොවි සමුපකාර හරහා ද මෙය සිදුකළ හැකි ය.
- කාන්තා ගොවීන් ඉලක්ක කර ගනිමින් ප්‍රවාහන පහසුකම් සහ වෙළෙඳපොළ අවකාශ ඇතුළු යටිතල පහසුකම් සකස් කිරීම.
- කාන්තා ගොවීන් විසින් නිපදවන ලද කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම සහ වෙළෙඳපොළ අනන්‍යතාවක් වර්ධනය කිරීම.
- කාන්තා ගොවීන් නායකයින්, ව්‍යවසායකයින් සහ ගොවි ප්‍රජාවන් අතර තීරණ ගන්නන්, වෙළෙඳපොළ පද්ධතිවල පාර්ශවකරුවන් සහ අනාගත ගැනුම්කරුවන් ලෙස නිරූපණය කිරීමේ ව්‍යාපාර ඇරඹීම.
- කාන්තා ගොවීන් විශේෂයෙන් ඉලක්ක කර ගනිමින් වෙළෙඳපොළ සම්බන්ධතා (වෙළඳ සල්පිල ආදිය) ඇති කිරීම.

# 03. මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය

මූල්‍ය සේවා සඳහා ප්‍රවේශය නොමැතිකම කාන්තා ගොවීන් යැපුම් ගොවිතැන් මට්ටමින් වාණිජ කෘෂිකාර්මික මට්ටමට පැමිණීම වළක්වන ප්‍රධාන ත ම බාධකයක් ලෙස හඳුනාගෙන තිබේ. ග්‍රාමීය කාන්තාවන්ට, විශේෂයෙන් කාන්තා ගොවීන්ට, ණය පහසුකම්, මූල්‍ය ප්‍රාග්ධනය සහ ඉතිරිකිරීමේ යාන්ත්‍රණයන් වැනි නියාමනය කරන ලද මූල්‍ය සේවා අතිශයින්ම දුර්ලභය.

කෙසේ වෙතත්, නියාමනය නොකරන ලද ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ග්‍රාමීය කෘෂිකාර්මික ප්‍රජාවන්හි ඉහළ මට්ටමකින් සිටින අතර, ග්‍රාමීය කාන්තාවන්ගේ අනාරක්ෂිතතාවන් භාවිත කරමින් ඔවුන් ව සූරාකෑම සම්බන්ධයෙන් දැඩි විවේචනවලට මුහුණ දෙමින් සිටී. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 45% කට වඩා ජීවත් වන්නේ දිනකට ඇමරිකානු ඩොලර් 5 ට අඩු (ලෝක බැංකුව, 2017) ආදායමකිනි. බොහෝ විට මෙම කණ්ඩායමට වැටෙන ග්‍රාමීය කාන්තා ගොවීන්ට මූලික හේතු දෙකක් නිසා බැංකුවලින් සේවා ලබා ගැනීම වළක්වනු ලැබ තිබේ: ඇපකර නොමැති වීම සහ ඇපකරුවන් ලබාදීමට ඇති නොහැකියාව. බොහෝ විට ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් විසින් ණය වාරික සතිපතා එකතු කරනු ලැබේ. වර්තමාන දේශීය සන්දර්භය තුළ කාන්තා ගොවීන්ට දැනටමත් වෙළෙඳපොළ වෙත පිවිසීම ඇතුළු විවිධ බාධක වලට මුහුණ දී සිටින අතරතුර, සතිපතා සැලසුම් කර ඇති ණය ආපසු ගෙවීම් මගින් ඇයගේ මූල්‍ය ධාරිතාව පිරිහීමට ලක් කෙරේ.

කාන්තා ගොවියෙකුට ණයක් ආපසු ගෙවීමට නොහැකි වූ විට, ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් විසින් සාමාන්‍යයෙන් ඇයට තවත් ණයක් ලබා ගැනීමට බලකරමින්, ඇයව තව දුරටත් දුර්වල කිරීමේ ණය චක්‍රයකට පොළඹවනු ලැබේ. ණය ආපසු ගෙවීමේ දී අඩුපාඩු සිදුවන අවස්ථාවල දී ණය එකතු කරන්නන් කාන්තාවන් විවිධ වාචික, ශාරීරික හා ලිංගික හිංසනයන්ට ලක් කරන බව වාර්තා වී තිබේ.

ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල මෙම මෙහෙයුම් ව්‍යුහය මඟින් ඵලදායී කෘෂිකාර්මික ශ්‍රමයෙහි නිරතවීමට කාන්තාවකට ඇති හැකියාව තවදුරටත් අඩපණ කර තිබේ. ඉහළ පොලී සහිත ණය ගෙවීම සඳහා කාන්තාවන් කෘෂිකර්මාන්තයෙන් මුළුමනින් ම ඉවත් වී විවිධාකාර දෛනික වැටුප් සහිත වැටුප් රැකියාවල නිරත වූ අවස්ථා බිම් මට්ටමේ පර්යේෂණවලින් හෙළි වී තිබේ

ලිපි ලේඛන සාමාන්‍යයෙන් ඉංග්‍රීසියෙන් මුද්‍රණය කර ඇති බැවින් කාන්තා ගොවීන් සාමාන්‍යයෙන් අන්තර්ගතය පිළිබඳ ව කිසිවක් නොදැන මෙම ණය සේවාවන් ලබා ගැනීම සඳහා වූ ගිවිසුම් අත්සන් කරනු ලැබේ. බැංකුවකට ඇපකර සහ ඇපකරුවන් ලබා දීමට සිදුවීම, ණය ලබාදීම ක්‍රියාවට නැංවීමට වැඩි කාලයක් ගතවීම සහ ණය අනුමත කිරීම අයදුම්කරුගේ ආපසු ගෙවීමේ හැකියාව මත රඳා පවතින බැවින් බැංකුවකින් මෙම සේවාවන් ලබා ගැනීමේ විකල්පය බොහෝ විට නොසලකා හරිනු ලැබේ. දැනටමත් විවිධ ආර්ථික හා සමාජීය දුෂ්කරතා සමඟ පොරබදමින් සිටින කාන්තා ගොවීන්ට ඉහත සඳහන් නිර්ණායකයන් තුළ හිතකර තත්වයක් නැත. ණය යෝජනා ක්‍රම සහ මූල්‍ය සේවා විකල්පයන් පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම, ඇපකරය නොමැතිකම හෝ ආදායමේ අස්ථාවරත්ව මගින් කාන්තා ගොවීන් විශ්වාසදායක මූල්‍ය සේවාවන් සඳහා ප්‍රවේශ වීමෙන් වළක්වයි. කාන්තාවන්ට වාණිජ කෘෂිකර්මාන්තයේ ක්‍රියාකාරී ව නිරත වීමට සහ වෙළෙඳපොළ පද්ධති සමඟ සම්බන්ධ වීමට ද එය බාධාවක් වේ.

**නිර්දේශයන්:**

- ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සඳහා දැඩි නියාමන හා අධීක්ෂණ යාන්ත්‍රණයක් ඇති කිරීම.
- ණය පහසුකම් සපයන විට වෙළඳපල හා වටිනාකම් එකතු කිරීම සම්බන්ධ අතිරේක තොරතුරු සහ සේවාවන් සැපයීම.
- විශේෂයෙන් කාන්තා-ගොවීන් ඉලක්ක කර ගනිමින් දිගු ආපසු ගෙවීමේ කාල සීමාවන් සහිත සමුපකාර ක්‍රමවේදය මත පදනම් වූ අඩු පොලී ණය යෝජනා ක්‍රම නිර්මාණය කිරීම.
- කාන්තා ගොවීන්ට ලබා ගත හැකි ණය සහ ණය පහසුකම් පිළිබඳ තොරතුරු සඳහා පහසු ප්‍රවේශයක් ඇති කිරීම.
- ණය සේවා ලබා ගැනීම සඳහා පූර්වාවශ්‍යතාවක් ලෙස සැපයිය යුතු ඇපකරයේ ස්වභාවය සංශෝධනය කිරීම.

## 04. තාක්ෂණය සඳහා ප්‍රවේශය

ගෝලීය වශයෙන්, කාන්තා ගොවීන්ගේ පිරිමි සගයන් හා සසඳන විට ඵලදායිතාව සැලකිය යුතු ලෙස අඩු වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රී පුරුෂ පාර්ශවයන් අතර අස්වැන්න පරතරය 20-30% ක් වේ. මෙම ස්ත්‍රී පුරුෂ පරතරය පැවතීම පිටුපස සිටින ප්‍රධාන ගැටළු ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කළහොත් මිලියන 36 ක පමණ ජනතාවක් කුසගින්නෙන් මිදිය මුදවා ගත හැකි වනු ඇත. (IFAD, 2014). කාන්තා ගොවින්ට තාක්ෂණයට ප්‍රවේශය නොමැතිකම කෘෂිකාර්මික ඵලදායිතාව සඳහා තම ශ්‍රමය උපරිම ලෙස භාවිත කිරීමට ප්‍රධාන ම බාධකයක් ලෙස සැළකේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිසා වෙනස් කොට සැලකෙන සමාජ සම්මතයන් හේතුවෙන්, ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන් සඳහා තාක්ෂණික දැනුම හා මෙවලම් ව්‍යාප්ත කිරීමේ දී පැහැදිලි ව ම අසමානාත්මතාවයේ තිබේ. පිරිමි ගොවීන් හා සසඳන විට උපාඛ්‍යාත සාක්ෂි සහ ක්ෂේත්‍ර මට්ටමේ සොයාගැනීම් මගින් ප්‍රබල ලෙස පෙන්නුම් කරන්නේ කාන්තා ගොවීන්ට ගොවිතැන් උපකරණ ලබා ගැනීම කලාතුරකින් සිදුවන බවත් සහ සමස්තයක් වශයෙන් සැලකිය යුතු ලෙස අඩු මෙවලම් ප්‍රමාණයක් හිමි ව තිබෙන බවයි. රටේ කාන්තා කෘෂිකාර්මික ශ්‍රම බලකාය මූලික වශයෙන් නුපුහුණු ශ්‍රමිකයන් වීම, කාර්යන් සඳහා බොහෝ කාලය ගත වීම, ශ්‍රමය වැඩියෙන් අවශ්‍ය වන කාර්යයන් හි නියැලීම සහ ප්‍රාථමික නිෂ්පාදකයින් ලෙස ආහාර වටිනාකම් දාමයන්හි පහළ මට්ටම්වල සිටීම මෙහි ප්‍රතිඵලය වී තිබේ.

කාන්තා ගොවීන්ට සහය දැක්වීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති කෘෂිකාර්මික ව්‍යාප්ති සේවාවන් සම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාවී සම්තයන් හා බැඳී තිබේ. කාන්තා ගොවීන්ට පවුල් පෝෂණය, ගෘහස්ථ ආහාර සුරක්ෂිතතාව, කාන්තා ගොවි සංවිධාන පිහිටුවීම ආදී විෂයයන් පිළිබඳ පුහුණුව ලබා දෙනු ලැබේ (කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 2014). ගොවිජන සේවා මධ්‍යස්ථාන යටතේ ලියාපදිංචි ගොවීන්ට තාක්ෂණික දැනුම හා පුහුණුව ලබා ගැනීමේ අවස්ථාව තිබේ. කෙසේ වෙතත්, ඉඩම් හිමියෙකු වීම ගොවිජන සේවා මධ්‍යස්ථානවල ලියාපදිංචි කිරීම සඳහා පූර්වාවශ්‍යතාවක් වන අතර, එය කාන්තා ගොවීන්ගෙන් බහුතරයකට ඉටු කිරීමට නොහැකි පූර්ව අවශ්‍යතාවකි. මෙය කාන්තා ගොවීන් තාක්ෂණික ධාරිතාවයෙන් තවදුරටත් ඈත් කරයි.

කෘෂිකර්ම අමාත්‍යංශයේ විෂය පථය යටතේ අනුරාධපුරයේ ගොවිපොළ යාන්ත්‍රික පුහුණු මධ්‍යස්ථානය සහ පශ්චාත් අස්වනු තාක්ෂණ ආයතනය විසින් නිකුත් කරන ලද වාර්තාවලට අනුව 2015 - 2018 කාලය තුළ පුහුණු කරන ලද ගොවීන්ගෙන් කාන්තා ගොවීන් ප්‍රතිශතය 10% කටත් වඩා අඩු ප්‍රමාණයක් වේ(FAO, 2018). තාක්ෂණයට ප්‍රවේශය නොමැතිකම කාන්තා ගොවියෙකුට ඵලදායිතාව ඉහළ නැංවීමට, වෙළෙඳපොළ වෙත විධිමත් ප්‍රවේශයක් ලබා ගැනීමට, වටිනාකම් දාමයන්ට සහභාගී වීමට හා සමස්ත පාඩු අව ම කිරීමට බාධාවක් වේ.

**නිර්දේශයන්:**

- සියලුම තාක්ෂණික දැනුම හා නිපුණතා පුහුණු වැඩසටහන් සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස කාන්තා ගොවීන්ගේ සමාන සහභාගීත්වය නියම කිරීම.
- පිරිමි කාර්යයන් සහ කාන්තා කාර්යයන් පිළිබඳ ව ස්ත්‍රී-පුරුෂ සමාජභාවී පක්ෂග්‍රාහී සමාජ සම්මතයන් පිළිබඳ ව ගොවි ප්‍රජාවන් සහ කෘෂිකර්ම උපදේශකයින් සංවේදී කිරීම)
- කාන්තා ගොවීන් සඳහා පරිශීලක-හිතකාමී තාක්ෂණික යෝජනා ක්‍රම හඳුන්වාදීම.
- ප්‍රජා මට්ටමේ සමාජ ව්‍යාපාර/සමාජ ක්‍රියාකාරිත්වයන් සහ සමාජ මාධ්‍ය හරහා කාන්තා ගොවීන්ගේ අනන්‍යතාව 'තාක්ෂණික දැනුමක් සහිත' වශයෙන් ප්‍රවර්ධනය කිරීම.
- කෘෂිකාර්මික ව්‍යාප්ති සේවා සැපයීම සඳහා කාන්තා නිලධාරීන් බඳවා ගැනීම වැඩි කිරීම.
- ඵලදායිතාව ඉහළ නැංවීම, වටිනාකම් දාමයන්හි ඵලදායී ලෙස යෙදීම වෙනුවෙන් තාක්ෂණය භාවිත කළ හැකි ආකාරය පිළිබඳ ව දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.

## 05. රැකවරණ වගකීම්

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ විරැකියා අනුපාතය සෑම වයස් මට්ටමක දී ම පිරිමින්ට වඩා දෙගුණයකටත් වඩා වැඩි වන අතර, විශේෂයෙන් කෘෂිකාර්මික කටයුතුවල දී, ගෙවීම් නොලබන පවුල් ශ්‍රමය තුළ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී කාන්තාවන් විශාල ප්‍රමාණයක් සිටිති (ආසියානු සංවර්ධන බැංකුව, 2015). ඵලදායී හා ප්‍රජනන වගකීම් යන දෙක ම සැලකිල්ලට ගැනීමේ දී ග්‍රාමීය කාන්තාවන් ඔවුන්ගේ පිරිමි සගයන් හා සැසඳීමේදී දිනකට වැඩි පැය ගණනක් වැඩ කරති.

කෘෂිකාර්මික අංශය තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවන් ඉතා පැහැදිලි ව පෙනෙන නමුත් ඒවා ගණනය කිරීම දුෂ්කර ය. කාන්තාවන් විසින් වැටුප් නොගෙවන රැකවරණය සහ ගෘහ සේවය යන දෙකටම අවධානය යොමු කර ඇති අතර ම යැපුම් ගොවිතැන සඳහා ඔවුන්ගේ භූමිකාව ද බොහෝ විට වැටුප් නොගෙවනු ලබන නිසා ග්‍රාමීය ආර්ථිකය සඳහා ඔවුන්ගේ දායකත්වය පුළුල් ලෙස වාර්තා වී නැත (ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2018).

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කාන්තාවන්ට ඔවුන්ගෙන් අපේක්ෂා කරන නිරන්තර සමාජ වගකීම් හේතුවෙන් තිබෙන අවස්ථා සීමිත වේ. කෘෂිකර්මාන්තයේ කාන්තා නියෝජනය අඛණ්ඩව අවතක්සේරු වී තිබේ - බොහෝ විට කාන්තාවන් සහ ඔවුන්ගේ අදාළ ප්‍රජාවන් පැල සිටුවීම, වල් නෙළීම, අස්වැන්න නෙළීම වැනි කෘෂිකාර්මික භූමිකාවන්ට ඔවුන් සම්බන්ධ වී යැපුම් ගොවිතැනේ ඉටුකරන ප්‍රමුඛ කාර්යභාරය නොතකා ඔවුන් ගොවීන් ලෙස හඳුනා නොගනී.

**නිර්දේශයන්:**

- ගොවි කාන්තාවන් අතර රැකවරණ කටයුතු හඳුනා ගැනීම සහ ඒවා නැවත එකිනෙකා අතර බෙදා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ පාර්ශ්වකරුවන් සහ සංවර්ධන ආයතන අතර ප්‍රතිපත්තිමය සංවාද ඇති කිරීම.
- කාන්තා ගොවීන්ගේ නිශ්පාදන හා ප්‍රජනක ශ්‍රම දායකත්වය පිළිගන්නා අතර ම රැකවරණ වගකීම් සහිත කාන්තා ගොවීන්ට අසමාන ලෙස බර පැටවීමෙන් වැළකී සිටීම පිළිබඳ පොදු කතිකාවක් ඇති කිරීම.
- ගෘහ වගකීම් ඉටු කිරීමේ දී පුරුෂයින්ගේ සහභාගීත්වය ඉහළ මට්ටමක පැවතීමේ වැදගත්කම පිළිබඳ ව ගොවි ප්‍රජාවන් සංවේදී කිරීම.
- බෝග චක්‍රයක් තුළ තෝරාගත් කන්නයක් සඳහාවත් කාන්තා ගොවීන් සම්ප්‍රදායික ප්‍රජනන භූමිකාවන්ගෙන් නිදහස් කිරීම වෙනුවෙන් ප්‍රජා මට්ටමින් අතිරේක ආධාරක පද්ධති ස්ථාපිත කිරීම.

  උදා: - ළමා රැකවරණ පහසුකම්, ආහාර බෙදා හැරීමේ යාන්ත්‍රණ.

## පශ්චාත්-කොවිඩ් යථාර්ථය පරීක්ෂා කිරීම: කාන්තා ගොවීන්ගේ හැකියාවන් හඳුනා ගැනීම සහ ආර්ථික ප්‍රතිපත්ති නැවත සකස් කිරීම

අර්බුදකාරී තත්වයක් තුළ, කාන්තාවන් සහ ළමයින් වඩාත්ම පීඩාවට පත්වේ. ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන්ගේ තත්වය මෙයට වෙනස් නොවේ. කොවිඩ් වසංගතය නිසා කාන්තා ගොවීන් මුහුණ දෙන අසමානතාවන් සහ වෙනස් කොට සැලකීම් උග්‍ර වී ඇති බව ක්ෂේත්‍රයේ උපාඛ්‍යාත සාක්ෂි වලින් පැහැදිලි වේ. කොවිඩ් වසංගතය හේතුවෙන්, දේශීය ආහාර නිෂ්පාදනය හා ප්‍රාථමික ජීවනෝපායන් වෙත මාරුවීම කෙරෙහි නව උනන්දුවක් ඇති වී තිබේ. කොවිඩ්-19 හි ප්‍රතිඵලයක් ලෙස ඇති වන ආර්ථික පසුබෑම වැඩි කාලයක් පවතිනු ඇතැයි ද, රටේ ආර්ථිකය නැවත ගොඩනැංවීමට නම් කෘෂිකර්මාන්තය ඉදිරි මාවත යැයි ද තිරසර සංවර්ධනයේ කතිකාවන් වඩ වඩාත් සනාථ කෙරෙමින් තිබේ. කාන්තාවන්ට එම ක්‍රමයේ අනිවාර්ය අංගයක් වීමට හැකියාවක් ඇත්තේ අතිරේක ශ්‍රම බලකායක් ලෙස නොව කාන්තා ගොවීන්, ව්‍යවසායකයින් සහ නායකයින් වශයෙනි. ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන් සංවර්ධනයේ හවුල්කරුවන් ලෙස පිළිගැනීම අවශ්‍ය වේ. මෙය සාක්ෂාත් කර ගැනීම සඳහා පළමු ව ඔවුන් මුහුණ දෙන අභියෝගයන්ට විසඳුම් ලබාදිය යුතු ය.

කොවිඩ්-19 හමුවේ ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා ආහාර නිෂ්පාදනය හා බෙදා හැරීම ඇණහිට තිබේ. වසංගතය පැතිරීම මැඩපැවැත්වීම සඳහා පනවා ඇති ඇඳිරි නීතිය සහ සංචාරක තහනම ගොවීන්ගේ ජීවනෝපාය දැඩි ලෙස අඩපණ කළ අතර රටේ සමස්ත ආහාර පද්ධතිය සහ ආහාර සුරක්ෂිතභාවය අවදානමට ලක්විය හැකි තත්වයකට පත් කළේ ය. ආනයනය මත ඉහළ මට්ටමකින් යැපීම නිසා කොවිඩ්-19 ආහාර හිඟයට ද හේතු විය. කොවිඩ් -19 පැතිරීම රටේ ආහාර පද්ධතියට දැඩි බලපෑමක් ඇති කර ඇති අතර පාරිසරික කෘෂිකාර්මික භාවිතයන් වෙත යොමුවීමේ අවශ්‍යතාව වඩ වඩාත් පැහැදිලි ව පෙනෙන්නට තිබේ. පසුගිය වසර 30 ක කාලය තුළ නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්ති මගින් තරයේම අඩපණ කරන ලද යැපුම් ගොවිතැන, දේශීය ආහාර නිෂ්පාදනය සහ කුඩා පරිමාණ ගොවීන්ට සහය වීම යන කරුණු දැන් නැවත ඇගයීමට ලක් කොට සංශෝධනයට ලක් කළ යුතු ය.

1977 දී විවෘත ආර්ථිකයක් වැළඳගත් දා සිට ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ පොහොර භාවිතය අතිශය ලෙස ඉහළ ගොස් තිබේ. මෙහි ප්‍රතිඵලය වී ඇත්තේ ගොවීන් තිරසර නොවන කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම හා සම්ප්‍රදායික දැනුමෙන් වැළකී සිටීම, බෝග විවිධාංගීකරණයෙන් වැළකී සිටීම හා තනි බෝග වගාකිරීම අනුගමනය කිරීම, පසෙහි පිරිහීම හෝ නිසරුභාවයට පත්වීම, පාරිසරික වශයෙන් කඩාකප්පල් වීම සහ නොදන්නා හේතු සහිත නිදන්ගත වකුගඩු රෝගය (CKDu) වැනි රෝග පැතිරීමයි. තනි භෝග ප්‍රවර්ධනය කිරීම කෘෂිකාර්මික නවීකරණයේ ප්‍රතිඵලයකි. කොවිඩ්-19 හි බලපෑම සම්බන්ධයෙන් කාන්තා ගොවීන් අතර පොදු හැඟීමක් වන්නේ ආහාර හිඟයකට මුහුණ දෙන ගොවියෙකුගේ ශෘහයක් යනු ඔවුන්ගේ දෙමව්පියන්ගේ පරම්පරාවල දී නම් සිදු නොවිය හැකිව තිබූ දෙයක් බවයි. එක් බෝගයක් පමණක් වගා කළ ගොවීන්ට එය ප්‍රමාණවත් ආහාර ප්‍රභවයක් ලෙස ගෘහ පරිභෝජනය සඳහා භාවිත කිරීමට හෝ කොවිඩ් සීමාවන් නිසා වෙළෙඳපොළේ විකිණීමට නොහැකි විය. රජයේ අනුමැතියෙන් ලබා දෙන ව්‍යාප්ති සේවාවන් දක්වා ඒ සඳහා දිරිගැන්වීමේ බලවේගයන් තිබෙන නිසා ශ්‍රී ලංකාවේ ගොවීන් තනි බෝග වගාවන්ට මාරුවීමේ වැඩි වීමක් ඇති බව ක්ෂේත්‍රයේ උපාඛ්‍යාත සටහන් මඟින් පෙන්වා දී තිබේ.

රසායනික පොහොර මත ඉහළ යැපීම හේතුවෙන් කාන්තා ගොවීන් කොවිඩ්-19 අගුලු දැමීමේ කාලය තුළ නිෂ්පාදනයෙහි නිරත නොවී ය. කොවිඩ් වසංගතය තුළ පොහොර සහ වෙළෙඳපොළ ප්‍රවේශය නොමැතිකම හේතුවෙන් නිෂ්පාදනය නැවැත්වීම නිසා බීජ වැපිරීම, අස්වනු නෙලීම හා ජලය දැමීම යන ඒවාට සීමා වූ කාන්තා ගොවීන්ට විශාල බලපෑමක් ඇති කර ඇති බව සම්මුඛ සාකච්ඡා වලින් ලද සොයාගැනීම් වලින් තහවුරු විය. කාන්තා ගොවීන් පැහැදිලි ව ම කියා සිටින්නේ කොවිඩ් වසංගතය මගින් ආදායම් උත්පාදනය සඳහා බාධා ඇතිකිරීම පමණක් නොව පශ්චාත් කෘෂිකාර්මික සන්දර්භයක් තුළ දී කාන්තා කෘෂිකාර්මික සේවිකාවන් සඳහා ගෙවනු ලබන වැටුප කෙරෙහි ද අහිතකර ලෙස බලපානු ඇති බවයි. කොවිඩ්-19 හමුවේ රැකියා අහිමිවීමෙන් පසු ගම්මානවලට ආපසු යාමට සිදු වූ ප්‍රධාන වශයෙන් කාන්තා ඇඟලුම් කම්කරුවන්ගේ නාගරික සිට ග්‍රාමීය ප්‍රදේශ දක්වා වූ හදිසි සංක්‍රමණය නිසා ලාභ ශ්‍රමය ඉහළ මට්ටමක පැවතීම මෙයට හේතුවයි.

ජාතික කෘෂිකාර්මික, ආර්ථික හා ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති තුළ දී ස්ත්‍රී පුරුෂ සමාජභාවය ප්‍රධාන ධාරාගත කිරීම අත්‍යවශ්‍ය වේ. කාන්තා ගොවීන්ගේ භාවිතයට නොගත් විභවතාවයන් සහ රටේ බිඳුණු ආහාර පද්ධතිය නිවැරදි කිරීමේ අනිවාර්ය අංගයක් ලෙස ඔවුන් පිළිගැනීමේ වැදගත්කම පිළිබඳව මහජන හා ප්‍රතිපත්තිමය කතිකාවක් නිර්මාණය කළ යුතු ය. සාකච්ඡාකරනු ලැබූ ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන් මුහුණ දෙන බාධක තුරන් කිරීම සඳහා රජයේ ප්‍රතිචාර දැක්වීම සහ වඩාත් කාර්යක්ෂමව ප්‍රතිකර්ම ලබා දීම අපේක්ෂා කරන ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ ධාරිතාවන් ඉහළ නැංවිය යුතු ය.

කාන්තා ගොවියෙකුට පිරිමි ගොවීන්ට සමාන අවස්ථාවන් සහ සම්පත් සඳහා ප්‍රවේශයන් ලබා දෙන්නේ නම්, අවසානයේ සමස්ත ඵලදායිතාව බෙහෙවින් වැඩිවන බව ඔප්පු කිරීමට ඕනෑ තරම් ගෝලීය සාක්ෂි තිබේ. කෘෂිකාර්මික අංශයට සහ ආහාර නිෂ්පාදනයට කාන්තා ගොවීන් දක්වන දායකත්වය අඩුවෙන් යෙදවීම හා අඩපණවීම හේතුවෙන් ඵලදායිතාව නැතිවීම සහ විභව ආදායම අහිමි වීම ඇස්තමේන්තු කළ යුතු ය. ශ්‍රී ලංකාවේ කාන්තා ගොවීන් මුහුණ දෙන මෙම ලේඛනයේ දක්වා ඇති ප්‍රධාන බාධක විසඳීම සඳහා දැඩි ක්‍රියාමාර්ග ගැනීමට ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදකයින්ට බල කිරීම සඳහා ඉහත සඳහන් ගණනය කිරීම්වල ප්‍රමාණාත්මක ප්‍රතිඵල උපකාරී වේ.

# මූලාශ්‍ර


කෘෂිකර්ම හා පරිසර සංඛ්‍යාලේඛන අංශය. (2002). *කෘෂිකර්ම සංගණනය. සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. https://www.statistics.gov.lk/agriculture/index.htm*

ආසියානු සංවර්ධන බැංකුව. (2015). *රටේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය තක්සේරු කිරීම ශ්‍රී ලංකාව යාවත්කාලීන කිරීම ආසියානු සංවර්ධන බැංකුව 6 ඒඩීබී මාවත, මැන්ඩලුයොන්ග් සිටි 1550 මෙට්‍රෝ මැනිලා, පිලිපීනය www.adb.org රටේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය තක්සේරු කිරීම ශ්‍රී ලංකාව. https://www.adb.org/sites/default/files/institutional-document/172710/sri-lanka-country-gender-assessment-update.pdf*

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව.(2014). *කාන්තා කෘෂිකාර්මික ව්‍යාප්ති සේවය. රජයේ තොරතුරු මධ්‍යස්ථානය. http://www.gic.gov.lk/gic/index.php/en/component/info/?id=2239&task=info*

සංගණන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (01.01.20/30.03.20). *ශ්‍රී ලංකා ශ්‍රම බලකායේ සහභාගීත්වය කාර්තුමය ප්‍රකාශනය ඍශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණය 1 වන කාර්තුව - 2020]. http://www.statistics.gov.lk/Resource/en/LabourForce/Bulletins/LFS_Q1_Bulletin_2020*

ජාත්‍යන්තර කම්කරු සංවිධානය. (2018). *රැකියා ස්ථානයේ ග්‍රාමීය කාන්තාවන්: හිඩැස් පියවීම. https://www.ilo.org/wcmsp5/groups/public/---ed_protect/---protrav/---ilo_aids/documents/publication/wcms_619691.pdf*

ආහාර හා කෘෂිකර්ම සංවිධානය. (2000). *කාන්තාවන් ලෝකය පෝෂණය කරයි. http://www.fao.org/3/x0262e/x0262e16.htm#:~:text=ON%20A%20GLOBAL%20SCALE%2C%20women,the%20labour%20for%20rice%20cultivation.*

ආහාර හා කෘෂිකර්ම සංවිධානය. (2011). *ප්‍රතිපත්ති වට මේසය: ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය. http://www.fao.org/3/mc065E/mc065E.pdf*

ආහාර හා කෘෂිකර්ම සංවිධානය. (2018). *ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ග්‍රාමීය අංශයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය තක්සේරු කිරීම. http://www.fao.org/3/CA1516EN/ca1516en.pdf*

ආහාර හා කෘෂිකර්ම සංවිධානය. (2020). *ගොවිතැනේ කාන්තා මුහුණ http://www.fao.org/gender/resources/infographics/the-female-face-of-farming/en/*

කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල. (2016). *ග්‍රාමීය කාන්තාවන්ගේ තාක්ෂණයන් හා නව්‍යකරණයන්හි එකතුව. https://www.ifad.org/documents/38714170/41246737/Compendium_Innovations_web.pdf/2ac139d1-5804-4212-bcf6-063587369db4*

මොනෑෂ් විශ්ව විද්‍යාලය සහ ඔක්ස්ෆෑම් ඕස්ට්‍රේලියාව. (2018). *පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ ඔවුන්ගේ ජීවිතය තුළ තිරසාර කෘෂිකාර්මික ජීවනෝපායන් සඳහා ග්‍රාමීය කාන්තාවන්ගේ සහභාගීත්වය සහ පිළිගැනීම https://www.monash.edu/__data/assets/pdf_file/0005/1779080/Rural-Sri-Lankan-women-in-agriculture-Exec-Summary.pdf*

ඔක්ස්ෆෑම්. (2017, ඔක්තෝබර්). කාන්තා ගොවීන්ට මුදල් සැපයීම: කෘෂිකර්මාන්තය සහ දේශගුණික අනුවර්තන සම්පත් වැඩි කිරීම සහ හරවා යැවීමේ අවශ්‍යතාව. *https://reliefweb.int/sites/reliefweb.int/files/resources/bp-financing-women-farmers-131017-en.pdf*

සොලොටාරොෆ්, ජේ. එල්., ජෝශප්, ජී., සහ කුරියකෝස්, ඒ. (2018). රැකියාවට යාම: ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ කාන්තාවන්ගේ විභවය අගුළු හැරීම (සංවර්ධනයේ දිශාවන්). ලෝක බැංකු ප්‍රකාශන.

WOCAN, FAO, & UNDP. (2013). *REDD+* සඳහා කාන්තාවන් ඇතුළත් කිරීම, වනාන්තර, කෘෂිකාර්මික හා අනෙකුත් ස්වභාවික සම්පත් කළමනාකරණ අංශවල හොඳ පුහුණුවීම් හරහා ශ්‍රී ලංකාවේ පාඩම්.



නීතිය හා සමාජභාරය
අංක 03, කින්සි ටෙරස්, කොළඹ 08, ශ්‍රී ලංකාව
දුරකතන : + 94 (0) 112684845
ෆැක්ස් : +94 (0) 112686843
ඊමේල්: admin@lstlanka.org
www.lstlanka.org


LAW & SOCIETY TRUST

WE EFFECT


මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන් ම හෝ අර්ධ වශයෙන් ස්වීඩන් ජාත්‍යන්තර සහයෝගීතා ඒජන්සිය (Sida) හා (We Effect) අරමුදලින් මුද්‍රණය කර ඇත. මෙහි එන අදහස් හා අන්තර්ගතයන්ට Sida හෝ We Effect ආයතන එකඟවීමක් අත්‍යවශ්‍යයෙන් ම නොවන අතර එය කතෘ හා ප්‍රකාශන ආයතනයේ වගකීම වේ.